ResearchGate

See discussions, stats, and author profiles for this publication at: https://www.researchgate.net/publication/363217424

# □□□□□□□□ □□□□□□□□ □□□□□□□□□ □□□□□□.

**Article** · September 2022

CITATIONS
0

READS
598

**1 author:**



Prasad Mallawa Arachchi
Rajarata University of Sri Lanka

**5** PUBLICATIONS **0** CITATIONS

SEE PROFILE

All content following this page was uploaded by Prasad Mallawa Arachchi on 02 September 2022.

The user has requested enhancement of the downloaded file.

# සම්භාව්‍ය පිරිවෙන් අධ්‍යාපනයේ ගමන්මග

**කථිකාචාර්ය එම්.ඒ ප්‍රසාද් කුමාර**
**මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය**
**B.A (Hons) in History (SJP), MPhil in History (KLN)**

**Email – prasadmallawaarachchi85@gmail.com**

## හැඳින්වීම

පැරණි සමාජීය පැවැත්ම හා ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකු වීමට අවශ්‍ය කරන සංකල්ප ප්‍රායෝගිකව ක්‍රියාත්මක වූ ආරාම මූලික කරගත් අධ්‍යාපන ක්‍රමය බුදුදහම මානව ශිෂ්ටාචාරයට උරුම කරදෙන දායාදයකි. මෙම අධ්‍යාපන ක්‍රවේදය ඉන්දියාවේ විවිධ ආරාම වල ව්‍යාප්ත වී දියුණු වූ අතර මිහිඳු මහරහතන් වහන්සේගේ ආගමනය තුළින් එකී ආරාමික අධ්‍යාපනය ලක්දිව ස්ථාපිත විය. පිරිවෙන යනු භික්ෂූන් වහන්සේගේ වාසය සඳහා ඉදි කෙරුණු කුටියයි. පිරිවෙන භික්ෂු වාසය සඳහා ඉදි කෙරුණු කුටියක් වුව ද එය හුදු වාසස්ථානයක් ම නොව භික්ෂූන් වහන්සේගේ ධර්මය හදාරන, ධර්මය ප්‍රගුණ කරන මධ්‍යස්ථානයක් ද විය. මූලාශ්‍ර වල සඳහන් වන ආකාරයට පිරිවෙන යන්න මුල පටන් ම අධ්‍යාපනික මධ්‍යස්ථානයක් වූ බව පෙනේ. අනුරාධපුර යුගයෙහි තිබූ මහාවිහාර පිරිවෙන, අබයගිරි පිරිවෙන, ජේතවන පිරිවෙන වැනි භික්ෂු වාසස්ථාන අධ්‍යාපන මධ්‍යස්ථාන ලෙස නිර්මාණය වී තිබුණි. මෙසේ බිහිවු ආරාමික අධ්‍යාපනයේ ස්වර්ණමය අවධිය කෝට්ටේ රාජසමයේ සනිටුහන් වූ අතර තොටගමුවේ විජයබා පිරිවෙන, පැපිලියානේ සුනේත්‍රාදේවී පිරිවෙන, දෙවිනුවර තිලකසිරි පිරිවෙන, කැරගල පද්මාවතී පිරිවන, වීදාගම සිරි සනානන්ද පිරිවෙන ආදී පිරිවෙන් මධ්‍යස්ථාන මෙම යුගයේ නිර්මාණය විය මෙසේ අනුරාධපුර යුගයේ සිට ක්‍රමිකව විකාශනය වූ පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය මහනුවර යුගය වන විට කෙබඳු ස්වරූපයක් ගත්තේ ද යන්න පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් මෙම ලිපියෙන් සිදු කෙරේ.

## විමර්ශනය

මෙරට ආවේණික වූ සම්භාව්‍ය පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය කෝට්ටේ යුගයේ දී ස්වර්ණමය යුගයක් දක්වා සේන්දු වුවත් 16 වන සියවසේ මෙරටට එල්ල වූ බටහිර බලපෑම් නිසා එම පැරණි අධ්‍යාපන ක්‍රමය බිඳ වැටිණි. 16 වන සියවසේ මෙරටට පැමිණි පෘතුගීසීන් හේතුවෙන් ශ්‍රී ලංකාවේ පිරිවෙන් අධ්‍යාපනයට අහිතකර තතත්වයක් උදාවිය. කෝට්ටේ හා සීතාවක ක්‍රමයෙන් විදේශීන් අතට පත්වීමත් සමඟ සිංහලයන්ගේ අනන්‍යතාවය තහවුරු කරන ආරක්ෂක පාලන මධ්‍යස්ථානය වශයෙන් කන්ද උඩරට රාජධානිය තෝරා ගැනුණි. එහෙත් එකී රාජධානිය ආරම්භක සමයේ වුව ද පිරිවෙන් හා මූලායතන වල පැහැදිලි දියුණුවක් දැකගත හැකි වූයේ නැත.

එසේ මහනුවර යුගයේ ආරම්භක සමයේ දී පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය තුළ පසුගාමී තත්ත්වයක් ඇතිවීම කෙරෙහි හේතුන් කිහිපයක් බලපෑ බව පෙනේ.

1. රාජ්‍ය ආරක්ෂාව හා අනුග්‍රහය නැති වී යාම.

2. කතෝලික හා ශිව ආගම් ව්‍යාප්ත කිරීමට බලයෙන් ක්‍රියා කිරීම.

3. පාලන තන්ත්‍රයේ අස්ථාවරභාවය හා දේශපාලන විප්ලවය.

4. දුර්වල ආර්ථිකය හා කුල භේදය.

5. පෘතුගීසීන් හා ලන්දේසි ජාතිකයන්ගේ ආගමික හා වාණිජ ව්‍යාපාර.

16 වන සියවසේ දී රජ පදවි ලත් උඩරට සිංහල රජුන්ට රාජ්‍ය රැක ගැනීම වෙනුවෙන් සුවිශේෂී කාර්යයභාරයක් සිදු කිරීමට වූ නිසා පිරිවෙන් අධ්‍යාපනය නගා සිටුවීම වෙනුවෙන් සැළකිය යුතු අවධානයක් යොමු වූයේ නැත. 16 වැනි සියවසට පෙර රජවරුන් රට සහ ජනතාව ආරක්ෂා කිරීම, බුදු සසුන රැක ගැනීම හා රටේ ආර්ථික දියුණුව යන අංශ 03 ප්‍රධාන වගකීමක් කොටගත්තත්, 16 වන සියවසින් පසුව මේ වගකීම නිසියාකාරව ඉටු කිරීමට හැකියාවක් බොහෝ රජවරුන්ට නොතිබිණි. උඩරට රාජධානියේ ආරම්භක පාලකයා වශයෙන් විමලධර්මසූරියත් (ක්‍රි.ව. 1592-1604) හා පසු කාලීනව බලයට පත් දෙවන විමලධර්මසූරිය රජුත් (ක්‍රි.ව. 1687-1707) සසුනේ දියුණුවට කටයුතු කළමුත්, පිරිවෙන් අධ්‍යාපනය නගා සිටුවීම සඳහා සැළකිය යුතු යමක් සිදු කළේ නැත. සෙනරත් (ක්‍රි. 1604-1635), දෙවන රාජසිංහ (ක්‍රි.ව. 1635-1687) රජුන් දෙපළට ද සඟ සසුන, බුදු සසුන හා අධ්‍යාපනික මූලායතන සම්බන්ධයෙන් නිසි අවධානයක් යොමු කිරීමට නොහැකි වූයේ එවකට රාජ්‍ය බලය සඳහා දේශීය හා විදේශීය වශයෙන් ව්‍යාකූල පරිසරයක් ගොඩනැගෙමින් පැවති හෙයිනි. උඩරට රජවරුන් පෘතුගීසීන් පලවා හැරීමට ලන්දේසීන්ගේ සහය පැතීමත් සමඟ මෙකී ව්‍යාකූලත්වය තවතවත් උච්ච වූ අතර එකී අස්ථාවරභාවයන් හමුවේ උඩරට රාජධානිය රැක ගැනීට පාලකයන් වෙහෙසුණා මිස පිරිවෙන් අධ්‍යාපනය නගා සිටුවීමට ප්‍රමුඛ දායකත්වයක් ඔවුන් වෙතින් ලැබෙන්නේ නැත.

යට කියන ලද දේශපාලන අස්ථාවර භාවයන් හමුවේ උඩරට රාජධානිය තුළ අධ්‍යාපන ආයතන ලෙස කීර්තියට පත්ව තිබූ පිරිවෙන් මුළුමනින් ම අභාවයට ගොස් තිබිණි. සිදුරුවානේ පැවති පරාක්‍රමබාහු පිරිවෙනත්, වලගම්පායෙහි වූ අභයරාජ පිරිවෙනත් මෙම වකවානුව තුළ අධ්‍යාපනික මධ්‍යස්ථාන වශයෙන් දියුණුව පැවති බවට ප්‍රමාණවත් සාක්ෂි හමු නොවේ.[2] එහෙත් සමකාලීන සමය වන විට නැති වී යන පිරිවෙන් අධ්‍යාපනය යම්තාක් දුරකට හෝ රැකගැනීමට ගණින්නාන්සේලා[3] යම් උත්සහයක් දැරූ බවට මූලාශ්‍ර සාධක ලැබේ. පිරිවෙන් අධ්‍යාපනය තුළ පැවති පසුගාමී තත්ත්වය සමනය කරමින් පන්සල් වල වාසය කළ ගණින්නාන්සේලා බණදහම් වෙනුවට ගර්හිත විද්‍යාව පුරුදු පුහුණු කළ බවට හැරම්ටිගල ධීරානන්ද හිමියන් විසින් සංස්කරණය කළ විමනාවත්ථු ප්‍රකරණය නම් කෘතියේ සඳහන් කර තිබේ.[4] සම්භාව්‍ය පිරිවෙන් අධ්‍යාපනය නගා සිටුවීමට ගණින්නාන්සේලා සෘජුව සම්බන්ධ නොවූවත් විහාරාරාම ආශ්‍රිතව වෙසෙමින් ඊට අදාළ දේපළ හා පොත්පත් රැකගැනීමට ගත් උත්සහයක් පිළිබඳ මූලාශ්‍ර තොරතුරු ලැබෙන නිසා එකී කාර්යභාරය පිරිවෙන් අධ්‍යාපනය යම් ස්ථාවරත්වයකට ගෙන ඒමට ආලෝකයක් වූවාට සැක නැත.

ඉහත කී පරිදි බාහිර හා අභ්‍යන්තර උවදුරු මධ්‍යයේ නැති වී ගිය පිරිවෙන් අධ්‍යාපනය ගණින්නාන්සේලාගේ ක්‍රියාකලාපය නිසා යම්තාක් දුරකට හෝ රැකෙන අතර එය ප්‍රබෝධමත් වී පුනර්ජීවය ලබන්නේ මහනුවර යුගය තුළ පහළ වූ වැලිවිට සරණංකර හිමිගේ කාලයේ දී ය. උන්වහන්සේගේ ප්‍රමුඛත්වයෙන් පිහිට වූ පර්ෂදය නිසා සම්භාව්‍ය පිරිවෙන් අධ්‍යාපනය හා ඒ ඇසුරෙන් නිර්මාණය වන ශාස්ත්‍රීය පුනරුදය යළි ආරම්භ විය. ශ්‍රී වීර පරාක්‍රමනරේන්ද්‍රසිංහ රජුගේ ද

අනුග්‍රහය ලබා මාපිටිය නවරන්ත මුදියන්සේ නියමකන්ද නැමති ස්ථානයේ ආරම්භ කළ පිරිවෙන මෙවක මුල්ම ශ්‍රස්ත්‍රායතනය ලෙස සැලකේ. "උඩුදුම්බර ඇම්බැක්කේ දේවාලයට නුදුරු ජායුදකසම්පන්න තපෝජන මනෝනන්දනීය සුන්දරතර නියමකන්ද යන වන ප්‍රදේශයෙහි විශාල ශාලාගෘහ පවක්ත්‍යාදින් සමුපේත කොට කරවන ලද......"[5] වශයෙන් මෙම නියමකන්ද පිරිවෙන පිළිබඳ ව දීර්ඝ විස්තරයක් සංඝරාජ සාධු චරිතය නම් කෘතියේ දක්වා ඇත. මහාචාර්ය පුංචි බණ්ඩාර සන්නස්ගල සාහිත්‍ය වංශය නම් කෘතියේ දී නියමකන්ද පිරිවෙන පිළිබඳ ව මෙසේ විග්‍රහ කර තිබේ. "එය එදා ශ්‍රී ලංකාවේ භික්ෂු අධ්‍යාපනය පිළිබඳ ව පැවති මධ්‍යස්ථානයක් විය. සියගණන් භික්ෂූහු එහි ඉගෙන ගත්හ. එහෙයින් ධර්ම ශාස්ත්‍රය ලංකාවට බෙදා දුන් තැන හැටියට නියමකන්ද වෙසෙසින් සහි කළ මනාය. පොතපත ලියැවමින් පඩිවරුන් පහළවී සියවස් දෙකකට වැඩි කාලයක් තුළ භික්ෂු අධ්‍යාපනය නැතිවීමෙන් මෙරට තිබූ දැඩි ශාස්ත්‍රාන්ධකාරය නැති වී ශාස්ත්‍රාලෝකයෙහි දිවයින බැබළීම ආරම්භ වූයේ මෙතැන් සිටය"[6] යනුවෙනි. එකී ප්‍රකාශය අනුව තැනින් තැන විසිරී සිටින ශිෂ්‍යයන් හා එකතු වී ස්ථිර වාසස්ථානයක් ද නොමැතිව තැනින් තැන ඇවිදමින් රටපුරා සිදුකළ ධර්ම ශාස්ත්‍රීය ව්‍යාපාරයේ කේන්ද්‍රස්ථානය බවට නියමකන්ද පිරිවෙන පත් වූ බව හඳුනාගත හැකිය.

මෙම අධ්‍යාපනික ආයතනය සඳහා රාජ්‍ය අනුග්‍රය ද නොඅඩුව ලැබුණ බව පෙනේ. කීර්ති ශ්‍රී රාජසිංහ රජු නියමකන්ද පිරිවෙනේ ගුරු ශිෂ්‍ය දෙපක්ෂයේ නඩත්තුව සඳහා ගම්පොළ අටුවෙන් සහල් සහ අනෙකුත් දානෝපකරණ සපයා දුන් බව"සරණංකර සංඝරාජ සමය" නම් කෘතියේ සඳහන් වේ.[7] එසේම තුන්මසකට වරක් පොතපත ලිවීමට අවශ්‍ය පුස්කොළ 300 බැගින් ප්‍රධානය කිරීම රජුගේ වැදගත් කාර්යයකි.[8] සරණංකර හිමිගේ කාරයභාරය නිසා ප්‍රසාදයට පත් රජ ලක්දිව ශාස්ත්‍ර ශාලා පිහිටුවා පිරිවෙන් අධ්‍යාපනය නගා සිටුවන්නට ප්‍රමාණවත් දායකත්වයක් ලබා දුනි.[9] අස්ගිරි, මල්වතු විහාර වලත්, ගංගාරාමය, සුදුහුම්පොල, නිත්තවෙල එසේ පිහිට වූ භික්ෂු ශාස්ත්‍රශාලා වලට නිදසුන් ය. මේවා සෘජුව පිරිවෙන් නමින් හඳුන්වා නොතිබුණත් පිරිවෙන් තුළින් සිදු කරන ලද කාර්යභාරය ඒ ආකාරයෙන් ම ඉටු වන පරිදි ශාස්ත්‍රශාලා ලෙස වර්ධනය වූ බව පැහැදිළිය. එයින් නොනැවතුණු රජ වලංගු අධ්‍යාපනයක් පවත්වාගෙන යාමට හැකිවන සේ රාජකාරි ඉටු කිරීමට ශිල්පශාලා ව්‍යවස්ථා නිලය නම් තනතුරැක් ද ඇති කළේය.[10] මේ අනුව සංඝරාජ සමය වන විට පිරිවෙන් අධ්‍යාපනය රාජ්‍ය අනුග්‍රහය යටතේ යම් ස්ථාවරත්වයකයට පත් වූ බව පෙනේ.

සරණංකර හිමියන් ගොඩනැගු අධ්‍යාපන ආයතන වල මූලික අධ්‍යාපනය සඳහා හෝඩිය, මඟුල් ලකුණ, ගණදෙවි හැල්ල, වදන් කවිපොත, බුද්ධ ගද්‍යය හා සකස්කඩය ඇතුළත් විය.[11] දෙවනුව නාමාෂ්ටක ශතකය, අනුරුද්ධ ශතකය, ප්‍රත්‍ය ශතකය ආදී පොත් කියැවීමට සළස්වා තෙවනුව වෘත්තීය අධ්‍යාපනයකට නැඹුරු වූ විෂයන් ඉගෙනීමට යොමු කරවන ලදී.[12] පිරිවෙන් අධ්‍යාපනය ඇසුරු කරමින් සාහිත්‍ය දියුණුවක් ඇති කිරීමට උත්සහ ගත් සරණංකර හිමි පාලි භාෂා දැනුම ද ශිෂ්‍යයා සතු කිරීමට වගබලා ගත්තේ ය.[13] මුණිගුණාලංකාරය, අභිසම්බෝධි අලංකාරය, සතර බණවර සන්නස, මහාබෝධි වංශ සන්නස, රතනත්‍රය ප්‍රණාම භාෂා සන්නය, රූප මාලාව, පාලි සන්දේශය වැනි කෘතීන් රැසක් සාහිත්‍ය ක්ෂේත්‍රයට දායාද වන්නේ සරණංකර හිමි වෙතින් ඇරඹුණු ශාස්ත්‍රායතන වල පුනර්ජීවනය හේතුවෙනි.

මෙසේ සඟරජ හිමියන් විසින් උඩරට රාජධානිය කේන්ද්‍ර කරගනිමින් සිදුකළ බෞද්ධාගමික පුනර්ජීවනය ක්‍රි.ව 1753 දී සිදුකරන ලද සියම් උපසම්පදාවත් සමග තවතවත් ආලෝකමත් විය. සරණංකර හිමියන් හා කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කැපවීම මත පෝයමළු විහාරයෙහි සිදුකළ උපසම්පදා විනය කර්මය සඳහා පහතරටින් භික්ෂූන් වහන්සේලා විශාල ප්‍රමාණයක් පැමිණ තිබේ. සිටිනාමළුවේ ධම්මජෝති, වේහැල්ලේ ධම්මදින්න සහ වටරක්ගොඩ ධම්මපාල යන හිමිවරු මුල් කරගනිමින් පහතරට භික්ෂු පරම්පරා 2ක් ආරම්භවන ආකාරය දැකිය හැකිය. එනම් වේහැල්ල භික්ෂු පරම්පරාව හා මුල්කිරිගල භික්ෂු පරම්පරාවයි. මෙම පරම්පරා මුල්කර ගනිමින් දකුණු පළාත තුළ ශාස්ත්‍රශාලා අභිවර්ධනයක් සිදුවන අතර එය සරණංකර හිමි විසින් ඇරඹූ ශාස්ත්‍රශාලා පුනර්ජීවනයේ පසුකාලීන ප්‍රතිඵලයක් වශයෙන් ද හඳුනාගත හැකිය.

මුහුදුබඩ ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් ඇති වූ වේහැල්ල භික්ෂු පරම්පරාවේ පුරෝගාමීන් වශයෙන් සිටිනාමළුවේ ධම්මජෝති සහ වේහැල්ලේ ධම්මදින්න යන භික්ෂූන් දෙනම හඳුනාගත හැකිය. මේ අතරින් සිටිනා මළුවේ ධම්මජෝති හිමි වේහැල්ල පරම්පරාවේ ආදි කර්තෘන් වන බව මීගොඩ පඤ්ඤාලෝක හිමියන් "ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය" නැමැති කෘතියේ දක්වා ඇත.[14] මෙකී පරම්පරාවේ ජ්‍යෙෂ්ඨතමයා සිටිනාමළුවේ ධම්මජෝති හිමි වුවත් ශිෂ්‍ය පරම්පරාව වඩාත් ප්‍රසිද්ධියට පත්වූයේ වේහැල්ලේ ධම්මදින්න හිමිපාණන්ගේ නමිනි. මීගොඩ පඤ්ඤාලෝක හිමියන් දක්වන ආකාරයට වේහැල්ලේ ධම්මදින්න හිමි තිස්සමහාරාම විහාරස්ථානයේ දී පැවිදිබිමට ඇතුළත් වූ, කඳුරුපොකුණේ බුද්ධරක්ඛිත නවරත්න නම් ගණින්නාන්සේගේ ශිෂ්‍යවරයෙක් බව[15] වැඩිදුරටත් සඳහන්කර තිබේ.

පහතරට ප්‍රදේශයේ සිදු වූ ශාසනික හා ශාස්ත්‍රශාලා පුනර්ජීවනයේ ඉතා වැදගත් මෙහෙවරක් ඉටුකළ වේහැල්ලේ ධම්මදින්න හිමියන් පිළිබඳව සංඝරාජ සාධුචර්යාව නම් කෘතියේ මෙසේ දක්වා ඇත. "සංඝරාජ සාමි දරුවෝ ව්‍යාකරණ උගන්වා ප්‍රස්තාවේම පළමුවෙන් ම ව්‍යාකරණ ඒ ස්වාමි දරුවන්ගෙන් උගත් සිටිනා මළුවේ සිල්වත්, පින්වත් ගුණවත් තම උපාලි මහස්ථවිර සාමින්ගෙන් සාමණේර- තමන් උපසම්පදාවත් ලැබ ස්වකීය රාෂ්ට්‍රය වු මාතොට දිසාවට ම ගොස් කහදාවේ මුදියන්සේ විසින් කරවා දෙන ලද එම පන්සල්හි විසීමෙන් සඟී අටුවාදී  බොහෝ පොත් ලියවීමෙන්............."[16] යනුවෙනි. මේ අනුව සංඝරාජ හිමියන් යටතේ පාලි භාෂාව හදාළ වේහැල්ලේ ධම්මදින්න හිමියන් පන්සල් වල වාසය කරමින් ශාස්ත්‍රීය අභිවර්ධනයක් උදෙසා කටයුතු කළ බව පැහැදිලිය.  රත්නපුර හෙන්ගල් විහාරය කේන්ද්‍ර කර ගනිමින් ශාස්ත්‍රශාලා ප්‍රබෝධය ඇරඹූ උන්වහන්සේ එකී ශාස්ත්‍රශාලා දියුණුව මාතර, ගාල්ල, හම්බන්තොට, කැළණිය සහ බෙන්තර ආදී ප්‍රදේශවලටද ව්‍යාප්ත කළේය.[17] උන්වහන්සේගේ චතුර දේශන විලාසය හා ප්‍රඥා සම්පන්න බව අවබෝධ කරගත් උඩරට පාලක නරේන්ද්‍රසිංහ රජු රුහුණු කතරගම විහාරාධිපති පදවිය උන්වහන්සේට පිරිනැමූ බව[18]  මූලාශ්‍රවල සඳහන් වීම නිසා ශාස්ත්‍රශාලා පුනර්ජීවනයට උන්වහන්සේගෙන් සිදු වූ මෙහෙවර කවරාකාරද යන්න පැහැදිලිය. මාලිම්බඩ ධර්මධර, කිරිනැලියේ රතනජෝතී, කඹුරුපිටියේ සඟීධර ගුණරතන, කරතොට ධම්මාරාම වැනි බහුශ්‍රැත ශිෂ්‍ය පරම්පරාවක් වේහැල්ල සඟ පරපුර ඇසුරු කරමින් නිර්මාණය වන්නේ වේහැල්ලේ ධම්මදින්න හිමියන් විසින් ඇතිකළ ශාස්ත්‍රශාලා ප්‍රබෝධයේ ප්‍රතිඵල වශයෙනි.[19]

කන්ද උඩරට ඇති වූ ශාස්ත්‍රශාලා ප්‍රබෝධයේ පහස ලැබ දකුණු ලක ඉතා වැදගත් ශාස්ත්‍රීය මෙහෙවරක් ඉටු කළ කේන්ද්‍රස්ථානයක් වශයෙන් මුල්කිරිගලට ද වැදගත් තැනක් හිමිවේ. සියවස් ගණනාවක් තිස්සේ වනවාසී සංඝයා විසූ මූලායතනයක් වශයෙන් හඳුනාගත් මෙය වටරක්ගොඩ ධර්මපාල හිමියන්ගේ පුරෝගාමීත්වයෙන් නව භික්ෂු පරම්පරාවක් ලෙස නිර්මාණය විය.[20] සරණංකර හිමියන්ගෙන් ශාස්ත්‍රීය ආලෝකය ලැබූ ධර්මපාල හිමි තම ගුරු හිමියන්ගේ මග යමින් ශිෂ්‍යයන් දොළොස් නමකගෙන් විහාර පරම්පරා දොළසක් ආරම්භ කොට ඒ ආශ්‍රිතව අධ්‍යාපන ආයතන පවත්වාගෙන ගිය බව "ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය " නම් කෘතියේ සඳහන් වේ.[21] ඒවා මෙසේය.

(1) මීගහවෙල බුද්ධරක්ඛිත හිමි (නෙවොල්පිටිය හා පට්ටිපොළ විහාරය)

(2) වටරග්ගොඩ ධම්මධර හිමි (ගැටමාන්නේ විහාරය)

(3) වේපතඉර ඉන්ද්‍රසාර (මුලගිරි සහ වේපතඉර විහාරය)

(4) මල්හාගොඩ ආනන්ද (ඕකේවල විහාරය)

(5) වහකෝට්ටවත්ත සුමන ( වහකෝට්ටේ විහාරය)

(6) පොත්තෙවෙල බුද්ධරක්ඛිත (මොරකන්දෙගොඩ විහාරය)

(7) වලල්ගොඩ ධම්මිස්සර (කහවින්නේ විහාරය)

(8) කටුවන අත්ථදස්සි (මුල්ගිරි සහ කඩවැද්දුව තුන්බෝධි විහාරය)

(9) ගංගොඩගම දේවරක්ඛිත (මුල්ගිරි සහ කෝංගල විහාරය)

(10) බෙලිගල්ලේ ධම්මජෝති (මුල්ගිරි රජමහා විහාරය)

(11) නලගම මනරතන (විල්ලද්දර විහාරය)

(12) කෝනාගම චන්ද්‍රජෝති (ගල්තෙම රාජමහා විහාරය)[22]

මේ කියන ලද ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා තමන් විසූ විහාරස්ථානවල ශිෂ්‍යන්ට ඉගැන්වීම් කටයුතු සිදු කරමින් විහාරය ආශ්‍රිතව අධ්‍යාපන මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලැබූ බව පෙනේ. ඒ අනුව සෘජුව පිරිවෙන් නමින් හඳුන්වා නොතිබුණත් එකී විහාරස්ථාන ආශ්‍රිතව සැළකිය යුතු අධ්‍යාපනික හා ශාස්ත්‍රීය ප්‍රබෝධයක් ඇති වූ බව පැහැදිලිය. මේ සියල්ල වැලිවිට සරණංකර හිමියන් විසින් උඩරට රාජධානිය මුල්කර ගනිමින් ඇති කරන ලද ශාස්ත්‍රීය පුනරුදයේ පසුකාලීන ප්‍රතිඵල වශයෙන් හඳුනාගත හැකිය.

යට සඳහන් කරුණු අනුව සඟරජ හිමියන් විසින් නියමකන්දෙන් පටන්ගත් ශාස්ත්‍රශාලා පුනර්ජීවය උන්වහන්සේගේ ශිෂ්‍ය පරම්පරා විසින් උඩරට ප්‍රදේශවලත්, දකුණු ප්‍රදේශවලත් ව්‍යාප්ත කරන ආකාරය පසුකාලීනව දැකිය හැකිය. මහනුවර යුගයේ දී සරණංකර හිමි යටතේ වූ අධ්‍යාපන මධ්‍යස්ථාන වලින් අධ්‍යාපනය හැදෑරූ වලානේ සිද්ධාර්ත නාහිමියන් රත්මලානේ පරමධම්ම චේතිය

පිරිවෙනත්, ශ්‍රී සුමංගල නාහිමියන් 1873 දී විද්‍යෝදය පිරිවෙනත්, රත්මලානේ ධර්මාලෝක හිමියන් 1875 දී විද්‍යාලංකාර පිරිවෙනත් ආරම්භ කරන්නේ උඩරට රාජ්‍ය සමයේ වැලිවිට ශ්‍රී සරණංකර හිමි යටතේ පිරිවෙන් අධ්‍යාපනය තුළ ඇති වූ පුනර්ජීවනයේ පසුකාලීන ප්‍රතිඵල වශයෙනි.[23] අනියම් ලෙස බැලූ කළ දහඅටවැනි සියවසේ කන්ද උඩරට කේන්ද්‍රගතව ගොඩනැගුණ ආගමික හා ශාස්ත්‍රශාලා පුනර්ජීවනය සරණංකර හිමි ජීවමාන සිටි සමයේ දී ම උඩරටින් අතුරුදහන් වූ බවට සාධක ලැබුණත්, දකුණු පළාත කේන්ද්‍ර කර ගනිමින් ඇතිවන ශාස්ත්‍රශාලා දියුණුවට සරණංකර හිමියන්ගේ කාර්යභාරය ආලෝකයක් වූ බව ඉන් පැහැදිළි වේ.

සමස්තයක් ලෙස සළකා බලන විට මිහිඳු මාහිමියන්ගේ ආගමනයත් සමඟ ශ්‍රී ලාංකේ සමාජය තුළ ස්ථාපිත වූ පිරිවෙන් අධ්‍යාපනය කෝට්ටේ රාජ සමයේ දී ස්වර්ණමය අවධියකට පැමිණ බටහිර ජාතීන්ගේ ආගමනයත් සමඟ සැළකිය යුතු පසුබෑමකට ලක්වන බව පැහැදිලිය. මෙම තත්ත්වයෙන් පිරිවෙන් අධ්‍යාපනය රැක ගැනීමට උඩරට මුල් පාලකයන් කිසිවෙක් සමත් නොවන අතර විහාරාරාම හා පොත්පත් යම්තාක් දුරකට හෝ ආරක්ෂා වූයේ ගණින්නාන්සේලාගේ භූමිකාව නිසාය. ඔවුන් රැකගත් බෞද්ධ පිරිවෙන් සම්ප්‍රදාය වැලිවිට ශ්‍රී සරණංකර හිමි යටතේ පුනර්ජීවය ලැබීමක් 18 වැනි සියවසේ දී දැකිය හැකි වන අතර එකී පුනර්ජීවය 19 වැනි සියවසේ ලංකාවේ දකුණු පළාත මුල් කරගනිමින් ඇති වූ පිරිවෙන් අධ්‍යාපනයට පූර්වාදර්ශ සැපයූ නිසා සරණංකර සංඝරාජ සමය පිරිවෙන් අධ්‍යාපන ඉතිහාසයේ සංධිස්ථානයක් වශයෙන් දැක්විය හැකිය. දේශපාලන ව්‍යාකූලතා මධ්‍යයේ වුව ද සම්භාව්‍ය පිරිවෙන් අධ්‍යාපනය යම්තාක් දුරකට හෝ සුරක්ෂිත කිරීමට මහනුවර රාජධානි සමයේ දී රජවරුන්, භික්ෂූන් හා මහජනතාව ගෙන ඇති උත්සහය අගය කළ යුතුය.

**ආන්තික සටහන්**

1. රැබේරු, රංජිත්, ***ලංකාවේ අධ්‍යාපන පරිණාමය***, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1964, 2-7 පිටු.

2. අධිකාරී, අබයරත්න, ***ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය සහ මහ සඟන***, තිසර ප්‍රකාශන, නුගේගොඩ, 1991, 256 පිටු.

3. ***සිංහල විශ්ව කෝෂයට*** අනුව ගණින්නාන්සේ යනු භික්ෂු ප්‍රතිපත්තියෙහි පිරිහී ගියා වූ උපසම්පදා නොවූ පිරිස වේ. මොවුන් සිවුරක් පොරොවාගෙන ඊට උඩින් පටියක් බැඳීම සිදු කළ අතර සමහරුන් යටින් කසාවතත් ඇඳ ඊට උඩින් සුදු රෙද්දක් ඇඳ සිටි බව බව රොබට් නොක්ස් එදා හෙළදිව කෘතියේ දක්වයි. ගණින්, ගණින්නාන්සේ, ගණල්ලෝ, ගණයි යන නම් වලින් ද හඳුන්වා ඇත.

4. ***සිංහල විමාන වත්ථු ප්‍රකරණය***, (සංස්) හැරම්ටිගල්ලේ ධීරානන්ද, පිටු 195-196 (වැඩි විස්තර සඳහා තල්වත්ත, අජිත්, දහඅටවන සියවසේ කන්ද උඩරට බෞද්ධ පුනර්ජීවනය, සූරිය ප්‍රකාශන, කොළඹ, 2015, පිටු, 67 බලන්න)

5. ***සංඝරාජ සාධු චර්යාව***, (සංස්) හෙන්පිටගෙදර පියනන්ද හිමි, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ 1963, පිටු, 8 (වැඩිදුර විස්තර සඳහා අධිකාරී, අබයරත්න, ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනයට සහ මහසඟන, 257 පිටුව බලන්න)

6. සන්නස්ගල, පුංචි බණ්ඩාර, ***සිංහල සාහිත්‍ය වංශය***, ලේක්හවුස්, කොළඹ, 1961,392 පිටුව.

7. වාඩිස්සර, කොටගම, ***සරණංකර සංඝරාජ සමය,*** විසිදුන ප්‍රකාශන, 1960, 226-228 පිටුව.

8. කිරිඳිගල්ලේ ධම්මරතන "වැලිවිට සංඝරාජ මාහිමියන් නිසා ඇති වූ අධ්‍යාපනය, ***වැලිවිට***

***සරණංකර සංඝරාජ ප්‍රණාමය*** , (සංස්) තරුල්ලේ ධම්මරතන සහ වෙනත් අය, 43 පිටුව.

9. ***මන්දාරම් පුවත,*** (සංස්) ලබුගම ලංකානන්ද හිමි, අනුල මුද්‍රණාලය, මරදාන, 1958, 634-647 පිටුව.

10. ***ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ශාස්ත්‍රීය සංග්‍රහය***, 1981, පිටු, 9 (වැඩිදුර විස්තර සඳහා අධිකාරී අබයරත්න, ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය සහ මහ සඟන, 258 පිටුව බලන්න)

11. ***සංඝරාජ සාධු චර්යාව***, (සංස්) හෙන්පිටගෙදර පියනන්ද හිමි, 10-28 පිටුව.

12. එම, 5-6 පිටුව.

13. පියසේන ඒ.ජී, ***මහනුවර යුගයේ පාලි සාහිත්‍ය*** 1, කැළණිය විශ්ව විද්‍යාලය, කැළණිය, 2016, 30 පිටුව.

14. පඤ්ඤාලෝක, මීගොඩ, ***ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය***, ගොඩගේ සහ සමාගම, කොළඹ, 2002, 344 පිටුව.

15. එම, 345 පිටුව.

16. ***සංඝරාජ සාධුචරියාව***, සංස්, හෙන්පිට ගෙදර පියනන්ද, 25 පිටුව.

17. හේවාවසම් ප. බ. ජී, ***මාතර යුගයේ සාහිත්‍යධරයන් හා සාහිත්‍ය නිබන්ධන***, 35 පිටුව.

18. අමරවංශ අකුරටියේ, "වැලිවිට සරණංකර සංඝරාජයාණන් වහන්සේගෙන් දකුණු පළාතට සිදු වූ ධර්ම ශාස්ත්‍රීය හා ශාසනික සේවය" වැලිවිට සරණංකර සංඝරාජ ප්‍රණාමය, (සංස්) තරුල්ලේ ධම්මරතන සහ වෙනත් අය, 50-53 පිටුව.

19. ඥානවිමල, කිරිඇල්ලේ, ***වෙහැල්ලේ ධම්මදින්න ස්වාමීන්ද්‍ර ශාසන ඉතිහාසය***, 59-62 පිටුව.

20. සුමනජෝති, ශ්‍රී පල්ලත්තර, ***මූලගිරි සංඝ සභාව***, ගාල්ල, 1949, 51 පිටුව.

21. පඤ්ඤාලෝක, මීගොඩ, ***ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය***, 359 පිටුව.

22.ගුණානන්ද, දෙහිගස්පේ, ***මූලගිරි විහාර වංශය***, උපාලි ඕෆ්සෙට් සමාගම, වැලිගම, 1993, 10 - 20 පිටුව.

23. ධර්මකීර්ති හිමි නිවන්දම, **ශ්‍රී ලංකාවේ 2500 වසරක සංක්ෂිප්ත ශාසනික ඉතිහාසය**, බෞද්ධ සංස්කෘතික දෙපාර්තුමේන්තුව, දෙහිවල, 185 පිටුව.



View publication stats